# ශ්‍රී ලංකාවේ යුද ගැටුම්වල බලපෑමට භාජනය වූ වවුනියා දිස්ත්‍රික් ජනතාවගේ ඉංග්‍රීසි භාෂා හැකියාව සහ ඉංග්‍රීසි ගුරු වෘත්තිකයන් පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්

ජයසීලන් ඥාණසීලන්


## සංක්ෂිප්තය

දේශපාලන සහ යුදමය හේතූන් නිසා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අස්ථාවර තත්ත්වයක් පැවතුන අතර වර්තමානයේ දී ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමේ සහ ඒ සඳහා වෘත්තීයමය පුහුණුවක් ලැබූ ගුරුවරුන්ගේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත. මෙම අවශ්‍යතාවය ඇති වී තිබෙන්නේ ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රමවේදය සහ ඒ සඳහා අදාළ පොත පතට අමතරවය. මෙම අධ්‍යයනය සඳහා 2005 වර්ෂයේ දී වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රධාන පෙළේ පාසැල් පහක සේවය කරන ලද ඉංග්‍රීසි ගුරුවර-ගුරුවරියන් 20ක ගෙන් අදාළ තොරතුරු එකතු කර ගන්නා ලදි. මෙම දත්ත එකතු කිරීම සඳහා ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන පර්යේෂණ ක්‍රමවේද දෙක භාවිත කරනු ලැබීය. අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි මෙම ප්‍රදේශයේ ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුවර-ගුරුවරියන්ට ඉංග්‍රීසි භාෂා භාවිතය පිළිබඳ මනා වෘත්තීය පුහුණුවක් ලබා දිය යුතුය. මෙම පුහුණු වැඩසටහන ජාතික සහ සංස්කෘතික අනන්‍යතාව රැකෙන පරිදි සංවිධානය කළ යුතුය. මේ සඳහා ගැඹුරු විමර්ශනයක් ද කළ යුතුව ඇති බැව් ද තව දුරටත් පැහැදිලි විය.


---

යොමු වචන :- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, අක්‍රීය ක්‍රියාකාරිත්වය, ගැටුම් කලාපය, ආකල්ප, අභියෝග